# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2011/2012**
**2014 අප්‍රේල්/ මැයි/ ජූනි**

**සමාජීය විද්‍යා පීඨය**

**මනෝවිද්‍යාව- PSYC - E3025**

**සෞඛ්‍ය මනෝවිද්‍යාව**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි** **කාලය : පැය 03 යි**

---

01. "සෞඛ්‍ය මනෝවිද්‍යාව විෂය ඥානය, වෛද්‍ය විද්‍යාව හා සමාජවිද්‍යාව වැනි වෙනත් විෂය ක්ෂේත්‍ර රාශියකට අයත් විෂය කරුණුවලින් සංයුක්ත වී ඇත." මෙම ප්‍රකාශය සම්බන්ධයෙන් සුදුසු නිදර්ශන සහිතව අදහස් දක්වන්න.

02. බටහිර ලෝකයේ වෛද්‍ය විද්‍යා විෂයෙහි හා සෞඛ්‍ය සංකල්පයෙහි වර්ධනය සිදු වූ ආකාරය සැකවින් විස්තර කරන්න.

03. සෞඛ්‍ය සම්බන්ධයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්වචන හා නිර්ණායක විකාශය වූ ආකාරය විමර්ශනය කරන්න.

04. එක්කෝ අන්තරාසර්ග පද්ධතියෙහි (Endocrine System) නැතහොත් මධ්‍යම ස්නායු පද්ධතියෙහි (Central Nervous System) කායච්ඡේදනය විස්තර කරමින් ඒ ආශ්‍රිත රෝග කවරේදැයි පෙන්වා දෙන්න.

05. සුදුසු - ක්ලමථකාරක වර්ගීකරණයක් ඉදිරිපත් කරමින්, ක්ලමථය විවිධ අවධි ඔස්සේ වර්ධනය වන ආකාරය විස්තර කරන්න.

06. කවර හෝ බෝ නොවන රෝග දෙකක් තෝරාගෙන ඒ කෙරෙහි බලපාන නිශේධනාත්මක චිත්තවේග ( Negative Emotions) පරීක්ෂා කරන්න.

07. නිශේධනාත්මක පෞරුෂ ලක්ෂණ හා මානසික සෞඛ්‍ය ගැටළු අතර සම්බන්ධතාව පරීක්ෂා කරන්න.

08. "ආයුර්වේද ක්‍රමය, සෞඛ්‍ය පිළිබඳ සමස්ථ ප්‍රවේශයක් නියෝජනය කරයි." මෙම ප්‍රකාශය උදාහරණ සමඟින් විමර්ශනය කරන්න.

************************************